# බඩේ අමාරුව



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# බඩේ අමාරුව



## පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

2 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කෘතියේ නම : බඩේ අමාරුව

ප්‍රථම මුද්‍රණය : 2025.01.24

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-482-4

පරිගණක අක්ෂර, පිටු සැකසුම

: සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy
- අළු කෑදැත්තා නිරීක්ෂණය
- මට හරියට වැඩ
- කවුද හොරා?
- මම තනියෙන්
- හරි වැඩේ...

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "හෙරණගත්කරණී 2024" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට

මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න, දවසක් මට බඩ රිදෙන්න ගත්තා.

මම අම්මාට කිව්වා, මගේ බඩ රිදෙනවා කියලා.

මොනවද දෝණි ඔයා නරක කෑමක් වත් කෑව ද? අම්මා මගෙන් ඇහුවා.

නරක කෑම කෑවාම බඩ රිදෙනවා එහෙනම්.






"මගේ බඩ රිදෙනවා!" මම අප්පච්චිටත් කිව්වා.

"ඔයා අත හෝදන්නේ නැතුව කනවා, නියපොතු හපනවා නේද? ඒක තමා ඔය බඩ රිදෙන්නේ. අසමෝදගම් ටිකක් බීල බලමු". අප්පච්චි රවාගෙන කිව්වා.

අත හෝදන්නේ නතුව කෑම කෑවම, නියපොතු හැපුවාමත් බඩ රිදෙනවා එහෙනම්.

"අය්යෝ! මගේ බඩ රිදෙනවා" මම අත්තම්මාට කිව්වා.

"පුතේ, ඔයා වතුර බොනවා අඩුයිනේ. මම හැම වෙලාවෙම කියනවනේ හොඳට උණු කරලා නිවාගත්ත වතුර බොන්න කියලා". අත්තම්මා ගියා මට බොන්න වතුර ගේන්න. වතුර අඩුවෙන් බිව්වමත් බඩ රිදෙනවා එහෙනම්.



“මගේ බඩ රිදෙනවා” මම ආයෙත් කිව්වා.

ඔන්න එතකොට, මල්ලි මගේ ළඟට අවිත් කිව්වා, “අක්කි ඔයා මගේ පේර ගෙඩිය හෝදන්නෙත් නැතුව හොරෙන් කෑවනේ, ඉතින් ඒකේ හිටපු පණුවෝ ඔයාගේ බඩ කනවා ඇති”. පළතුරු හෝදන්නෙ නැතුව කෑවාමත් බඩ රිදෙනවනේ.





අම්මා මට අසමෝදගම් ටිකක් දුන්නා, හැන්දකින් මැනලා.
ටික වේලාවකින්, මගේ බඩ රිදීම නැවතුනා.

මම ටිකක් කල්පනා කළා.

බඩ රිදෙන එක හරිම අමාරුයි.

ආයෙත් එහෙම නොවෙන්න, මම වැඩකරන්න ඕනෑ කියලා හිතට ගත්තා.




කෑමට පෙර හොඳින් අත හෝදන්න ඕනෑ.

දත් මැදලා, නාල පිරිසිදුව ඉන්නත් ඕනෑ.




ක්ෂණික කෑම කෙටි කෑම පමණට වඩා කෑමට ගන්නත් නරකයි.



මැස්සන් වගේ සතුන් වැසීමෙන් අපිරිසිදු වුණා, නරක් වුණා, කෑම කන්නත් හොඳ නැහැ.



දවසට නියමිත ප්‍රමාණයට උණු කර නිවාගත් වතුර බොන්නත් ඕනෑ.





පලතුරු, පලා වගේ අමුවෙන් කන කෑම හොඳින් සෝදා කෑමට ගන්න වෙනවා.

"ඔයාගේ බඩ රිදෙන එක හොඳයි ද?" හැමෝම මගෙන් ඇහුවා "ඔව්, මම ආයෙත් නරක දෙවල් කන්නෙත් නෑ. හොඳට පිරිසිදු වතුරත් බොනවා, නියපොතු හපන්නෙත් නෑ, අත් සෝදලා කෑම කනවා" මම කිව්වා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

9 786242 084824